# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලේ (IFAD) ඇමරිකානු ඩොලර් මිලියන 41.7 ක මූල්‍ය ආධාර ඇතිව, දරිද්‍රතාවය අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සඳහා දායක වීම සඳහා ග්‍රාමීය ගොවීන් 40,000 කගේ වගාකිරීමේ දී පරිසරයට අනුගතවීමේ හැකියාව සහ වෙළඳපල සහභාගීත්වය ගොඩනැගීම සඳහා කුඩා පරිමාණ, කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වසර 6ක් වන අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රදේශ වන්නේ උතුර (වව්නියාව, මන්නාරම), වයඹ (කුරුණෑගල, පුත්තලම), මධ්‍යම (මාතලේ), නැගෙනහිර (අම්පාර) සහ ඌව (මොණරාගල).

වැඩිදුර තොරතුරු සඳහා - **www.agrimin.gov.lk**

පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අදාල සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 01) - තනතුරු 01

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (ක්ෂේත්‍ර : කෘෂිකර්මය, වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය ආදිය) සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධිය.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක්

**හා**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද, එයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමේ සිටිය යුතුය.

02. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ (ක්ෂේත්‍ර : කෘෂිකර්මය, වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය යනාදී) සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධිය.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක්

**හා**

ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

**සමඟ**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද, එයින් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමේ සිටිය යුතුය.

03. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ (ක්ෂේත්‍ර : කෘෂිකර්මය, වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය ආදිය) සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකමක්

**හා**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

**සමඟ**

ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

**සමඟ**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද, එයින් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමේ සිටිය යුතුය.

### ගණකාධිකාරී (PS 04) - තනතුරු 01

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක්.

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද

02. රජයේ දීප ව්‍යාප්ත සේවයේ III/II පන්තියේ හෝ ඊට වැඩි හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයේ නිලධාරියෙක්.

**සමඟ**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 07 ක පළපුරුද්ද.

### තෝරා ගැනීමේ ක්‍රමය :

සුදුසුකම් සහ පළපුරුද්ද මත ලැයිස්තුගත කර අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ

### වැටුප් පරිමාණය :

වැටුප් 2019.03.05 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වේ.

### රැකියා කොන්දේසි :

රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් ද්විතීයික පදනමින් ද, රාජ්‍ය සේවයෙන් බැහැර පුද්ගලයන් කොන්ත්‍රාත් පදනමින් ද බඳවා ගැණේ. සියලුම පත්වීම් මුලින් වසරක කාලයක් සඳහා වන අතර සේවා දිගුව සාර්ථක කාර්ය සාධනය මත පදනම් වේ.

### වයස් සීමාව :

වයස අවුරුදු 61 ට වැඩි ඕනෑම පුද්ගලයෙකු ව්‍යාපෘතියට බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

### අයදුම්පත් :

සියලුම අයදුම්කරුවන් ඥාති නොවන දෙදෙනෙකුගේ නිර්දේශ සහිත ජීව දත්ත පත්‍රිකාවක්, සහතිකවල පිටපත් සමග පිළියෙල කර ලියාපදිංචි තැපෑල **2021 දෙසැම්බර් 27** දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

ඉල්ලුම් කරන ලද තනතුර සහ ව්‍යාපෘතියේ නම, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

ලේකම්

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය,
80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.